අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/04/05/22

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.07. 15

ස. ප. අං: ......... ම. අං: ........

.........................................................හිමි/ මයා/ මිය/ මෙය

.........................................................

.........................................................

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය යටතේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නව සේවා ව්‍යවස්ථාව අනුව 2021.11.28 දින පැවති සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවැත්වීමට නියමිත මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට ඔබ සුදුසුකම් ලබා ඇති බව සතුටින් දන්වා සිටිමි.

02. අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා බත්තරමුල්ල, පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 07 වන මහලේ ශ්‍රවණාගාරයට 2026.08.11 දින පෙ.ව. 7.00 ට පැමිණෙන ලෙස කාරුණිකව දන්වමි.

03. එදිනට පහත සඳහන් ශීර්ෂ I යටතේ සඳහන් සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් ඇතුළත් ගොනුවක් ද එම ලිපි ලේඛනයන්හි සහතික කරන ලද ඡායා පිටපත් ඇතුලත් කර ඊට අනුරූපි ගොනුවක් වෙනම ද ඉහත දක්වා ඇති සම්මුඛ පරීක්ෂණ අංකය සහ මණ්ඩල අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. සියලුම සහතිකපත්‍ර/ලේඛන පිටපත් මත ඒවා සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතු අතර, අයදුම්කරු විසින් ද ඒ බව සහතික කර තිබිය යුතුය.

I. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

i. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් ලිපිය
ii. ජාතික හැඳුනුම්පත
iii. උප්පැන්න සහතිකය
iv. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් ලබාගත් සම්පූර්ණ කරන ලද, නිල වෙබ් අඩවියෙන් බාගත කරගත් ඇමුණුම 02 ආකෘතිය
v. අධ්‍යාපන සහතික - අ.පො.ස. සාමාන්‍ය පෙළ, අ.පො.ස. උසස් පෙළ, ලිඛිත විභාගයෙන් සමත් විෂයයන්ට අදාළ වන උපාධි සහතික සහ සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛන, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකය, බඳවා ගැනීම් සුදුසුකම්වලට අදාළ වෙනත් සහතික

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.
moesecretaryoffice@gmail.co

Scanned with CamScanner

vi. මෙම ලිපියේ ඡේද අංක 05හි සඳහන් උපාධියේ අන්තර්ගතයෙන් 1/3ක් ඉල්ලුම් කරන ලද විෂයය සඳහා පවතින බව තහවුරු කිරීමේ ලිපිය

vii. දිවුරුම් ප්‍රකාශය (අවශ්‍යතාවය අනුව) - අදාළ අධ්‍යාපන සහතික සහ අනෙකුත් සහතික/ලේඛනවල සඳහන් නම්වල වෙනස්කම් පවතී නම් ඊට අදාළව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළයුතු වේ.

viii. මෑතකදී ලබා ගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකය (මාස 03ක් ඇතුළත)

ix. මෑතකදී ලබා ගන්නා චරිත සහතිකයක් (සාමදාන විනිශ්චයකාරවරයෙකු වෙතින්)

04. මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ඉහත ලිපි ලේඛන හා සහතිකපත් පරීක්ෂා කර, බඳවා ගැනීමේ **මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් සඳහා පමණක්** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එබැවින් අංක 2,162 හා 2020.02.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති බඳවා ගැනීමේ නිවේදනය හා එහි සංශෝධන සහ ඔබගේ අයදුම්පත්‍රය අනුව මූලික සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සියලුම සහතිකපත්/ලේඛන සහ සහතික කරන ලද ඡායා පිටපත් එදිනට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර පසුව ඉදිරිපත් කෙරෙන සහතිකපත්/ ලේඛන පිළිබඳව සළකා බැලීමක් සිදු නොකරන බව දන්වමි.

05. අදාළ උපාධි සහතික වල විස්තරාත්මක ප්‍රතිඵල ලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ ඉදිරිපත් කලයුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන සහතික සලකා බලනු නොලැබේ.

06. අයදුම් කර ඇති විෂය ධාරාව ප්‍රධාන විෂයක් ලෙස උපාධියට හදාරා ඇති බවට සහ උපාධියේ මුළු විෂය ඒකක (සම්බාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් අයදුම් කර ඇති විෂයට අදාළ විෂයයන් බවට තහවුරු කල හැකි සහතික/ලේඛන සහ එම කරුණු තහවුරු කර ගැනීමට අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් නිකුත් කළ තහවුරු කිරීමේ සහතිකයක් (www.moe.gov.lk නිල වෙබ් අඩවියේ පළකර ඇති ඇමුණුම 01 ආකෘතියට අනුව) සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළයුතු ය.

07. නිවේදනයේ සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සපුරාලනුයේ විදේශ විශ්වවිද්‍යාලයකින් ලබාගත් සහතික මත නම්, අදාළ විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් බවට එම කොමිෂන් සභාව විසින් නිකුත් කළ ලිපියක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන එවැනි ලිපි නැවත සලකා බලනු නොලැබේ.

08. නිවේදනයේ අංක 04.I හී අනු අංක i, ii හා iii යටතේ සඳහන් සාමාන්‍ය සුදුසුකම් සහ අංක 04.III හී සඳහන් පළපුරුද්ද අයදුම්කරුවන් විසින් නියමිත දිනට සපුරා ඇති බවට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා වන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සනාථ කල යුතුය. (ඇමුණුම 02 ආකෘතිය අනුව)

Scanned with CamScanner

09. අවම සුදුසුකම් යටතේ ඉල්ලුම්කර ඇති අයදුම්කරුවන් විසින් අදාළ විෂයය ක්ෂේත්‍රයේ ඉගැන්වීම් පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඇමුණුම 03 ආකෘතියෙන් සම්පූර්ණ කරන ලද ලේඛන සහ අදාළ පාසල්වල විදුහල්පති සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද ගුරු කාලසටහන් ඉදිරිපත් කලයුතුය. (ඇමුණුම 03 ආකෘතිය අනුව)

10. අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.

11. ලිඛිත විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතරම අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන්ම ලබාගෙන තිබීම අත්‍යවශ්‍ය නොවේ.

12. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් කැඳවන බැවින් මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පමණක් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ගැනීමට සුදුසුකමක් නොවන බව කාරුණිකව දන්වමි.

13. තවද මෙම ලිපිය ලද වහාම සතියේ දිනයන්හි රාජකාරි වේලාවක දී 0112-787083 යන දුරකථන අංකයට ඇමතුමක් ලබා දෙමින් ලිපිය ලද බව තහවුරු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්.ඩබ්ලිව්. චිත්‍රා රෝහිණී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ගුරු අධ්‍යාපනඥ)

එස්.ඩබ්ලිව්. චිත්‍රා රෝහිණී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ගුරු අධ්‍යාපනඥ)
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය", බත්තරමුල්ල.

අ.කළේ/ නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය

Scanned with CamScanner